# කියවන නුවණින් ජයගත් දරුවන්



සිසිර දිසානායක

සුබවාදී මතු දවසක් වෙනුවෙන් විදේශගතවන්නන් සංක්‍රමණය වූ පසුව මුහුණ පාන අභියෝග රැසකි. තමන්ගේ කුඩා දරුවන් නිවෙස්වල රඳවා රැකියා සඳහා යාම එක මූලික ගැටලුවකි. මව්බිමේදී නම් වැඩිහිටි කිසිවකුගේ හව්හරණය ලබාගත හැකිය. විප්‍රවාසී පිරිස්වලට එවන් වාසනාව ලැබෙන්නේ නම් ඒ මව්බිමෙන් මෙහි කැඳවාගෙන සිටින වැඩිහිටියන්ගෙනි. බොහෝ දෙනකු සංක්‍රමණය වන්නේ ද සිය දරුවන්ගේ මතු දවස පිළිබඳව සිතා බලා ය. මව්බිමේදීත් මේ අභියෝගයට මුහුණ දෙන පිරිස් නැතුවා නොවේ.




කුඩා දරුවන් සඳහා පවත්වාගෙන යන පෙර පාසල් දිවා සුරැකුම් මධ්‍යස්ථාන දෙමව්පියන්ට මහත් සහයක් වන්නේ ඒ නිසයි. වැඩිහිටියන් සමග නිවසේ රැඳවිය හැකි වුවච කෙටි කාලයකට හෝ පෙර පාසල් සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන වල තම දරුවන් රැඳවීමට තවත් හේතුවක් වෙයි. ඒවී ම



මධ්‍යස්ථාන වල කෙරෙන ක්‍රියාකාරකම් දරුවන්ගේ පෞර්ෂ්‍ය වර්ධනයට හිතකර වන නිසයි.  අනෙකුත් දරුවන් සමග එක්වීමට ලැබෙන අවස්ථාව ද පෞර්ෂ්‍ය වර්ධනයට හේතුවෙයි.

දරුවන් පොත පත ඇසුරු කිරීම අඩුවීම වර්තමානයේ අප සැම හට පොදුවේ බලපාන කාරණයක් බවට පත් වී ඇත්තේ ය. දරුවන්ගේ කියැවීමේ රුචිය ඉහළ නැංවීමට කටයුතුකිරීම ඔවුන්ගේ පෞර්ෂ්‍ය වර්ධනය කිරීමෙහිලා ඉතා වැදගත් වෙයි. දරුවන් කුඩා කාලයේදීම ඒ වෙනුවෙන් යොමු කරවීමට මෙරට ප්‍රධාන ප්‍රවාහයන් පවා උනන්දු වීම කාලීන කටයුත්තකි. එවන් වැඩ පිළිවෙලකට දායක වී ඉන් අගනා පළ නෙළාගන්නා දිවා සුරැකුම් දඹ්‍යස්ථානයක් පිළිබඳවයි මේ සටහන. ඒ අපේ මව්බිමෙන් මෙරටට සංක්‍රමණය වූ ප්‍රසන්න සහ ජයන්ති ඉලේසිංහ දෙපළ පවත්වාගෙන යන්නා වූ සිල්ක්වුඩ් ස්ටාර්ස් ළදරු පාසලයි (Silkwood Stars Learning Centre) වැඩ සටහනට සක්‍රියව දායක වී දරු දැරියන් 18 දෙනකු වෙනුවෙන් සම්මාන ලබා දීමට මේ දෙපළ ඇතුලු කාර්ය මණ්ඩලය සමත් වූහ. මේ පිළිබඳව අප හා පිළිසඳරකට එක් වෙමින් ප්‍රසන්න ඉලේසිංහ මුලින්ම කරුණු දැක්වීය.

"මේක වික්ටෝරියා ප්‍රාන්තයේ ප්‍රිමියර් ගේ අභියෝගයක් හැටියටයි ඉදිරිපත්වුණේ. දරුවන්ගේ කියැවීමේ රුචිය වැඩි කරන්න ගන්නා පිළියමක් විදියටයි මේ වැඩ සටහනය අපි වගේ ආයතනවලට දායක වෙන්න ආරාධනා කළේ"

ඔස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ ප්‍රධාන පාළක කෙවින් ඇන්ඩෘස් (Kevin Andrews) මහතා ගේ අදහසකි මේ.

"මේ වැඩ සටහන යටතේ කියවන්න සුදුසු පොත් විදියට පොත් 200 ක් විතර නම් කරලා තියෙනවා. එක එක මාතෘකා යටතේ කාණ්ඩ දහයකට විතර බෙදලා දීලා තියෙනවා. සුරංගනා කතා. ළමා නවකතා. ළමා කෙටිකතා වාගේ බෙදලා තියෙන මේ පොත් වල නම් ඒ ඒ කාණ්ඩ යටතේ අපි වෙබ් අඩවියෙන් තෝරාගන්න ඕනෙ. එහෙම එක කාණ්ඩයකින් එක පොතක් ගානේවත් තෝරාගෙන පොත් හොයාගන්න වෙනවා."



අප හා විස්තර කිරීමට මෙවර ඉදිරිපත්වූයේ ජයන්ති ඉලේසිංහ මහත්මියයි. පොත් සොයාගන්නේ කෙළෙසද කියැවීම කළේ කෙළෙසින්ද යන කාරණා පිළිබඳව අපි උනන්දු වූයෙමු.

"ක්නොක්ස් කවුන්සලේ (Knox City Council) පුස්තකාලය අපට උදව්වුණා. දෙමව්පියොත් හරියට උදනන්දු වුණා. ඇත්තටම අපි පොත් හතළිහක් විතර ළමයින්ට කියෙව්වා. නිකම් කියවන්න බෑ. දරුවන්ට කියලා දෙන්න ඕනෙ. වැඩ සටහනින් නිර්දේශකරලා තියෙන අභ්‍යාස කරවන්න ඕනෙ. මේ කාරණයෙදි දෙමව්පියන්ටත් ලොකු වැඩ කොටසක් පැවරුණා. ඒ අයත් සම්පූර්ණකරන්න ඕනෙ දේවල් අභයාස එහෙම තියෙනවා. ඇත්තටම පොතක් කියවන්න සතියක් විතර යනවා. දරුවන්ගේ වයසට ගැලපෙන පොත් තෝරාගන්න ඕනෙ. ඒ ඒ වයසට හරියන ක්‍රියාකාරකම් ඒ පොත් කියවන අතරේ කරන්න ඕනෑ. ඒ ක්‍රියාකාරකම් අදාල තැන් වලට වාර්තා කරන්න වුණා. පියවරෙන් පියවරට"

පොත් හතළිහක් විතර මේ ආකාරයට දරුවන්ට කියෑවීමට කොතෙක් කල් ගතවීද? දරුවන් කෙතරම් මේ සඳහා උනන්දු වීද?

"අපට මේ වැඩේට මාස හයක් විතර ගියා. දරුවනුත් පොත් කියවමින් තමයි ක්‍රියාකාරකම් කළේ. ඒ නිසා ඔවුන් හරි උනන්දුවෙන් මේ වැඩේට දායක වුණා. එක දරුවෙක් මේ පොත් හතළිහට අමතරව තවත් පොත් ගණනාවක් කියවලා විශේෂ තෑගිත් දිනාගත්තා. ඒඅ මතර කියවීම් කරන එකට කියන්නෙ ස්කැවෙන්ජර් හන්ට් චැලෙන්ජ් (Scavenger Hunt Challenge) කියලයි"

"මේ වැඩ සටහනට ඉදිරිපත්වෙලා දියත් කරන්න විශේෂයෙන් උනන්දුවුණේ සිල්ක්වුඩ් ස්ටාර්ස් අර්ලි ලර්නින් සෙන්ටර් මධ්‍යස්ථානයේ සේවය කරන චන්දනා කිලාරි (Chandana Khilari) කියන ඉන්දීය සම්භවයක් තියෙන ගුරුවරිය. ඇත්තටම අපි හැමෝම කලේ ඇයට උදව් වුණා එකයි"

"ඉතින් ස්කැවෙන්ජර් හන්ට් අභියෝගය ජයගන්න සියෝනා අයිරෝරා (Siyona Ayrora) ඇතුළු මේ දරුවන් ට සහතික පත් පිරිනැමුවේ කෙවින් ඇන්ඩෘස් මහත්මයාගේ බිරිඳ කැතරින් ඇන්ඩෘ (Catherin Andres) මහත්මියයි. මේ අයතනයේ ඉන්නේ නොයෙකුත් සම්භවයන්ගෙන් යුත් දරු දැරියන්. පිළිගැනීමේ කතාවත් නැටුමත් ගායනයත් ඉදිරිපත් කළේ ඝානා රටේ සංස්කෘතියට අනුවයි."

විද්‍යුත් මාධ්‍යයෙන් කියැවීමට වඩා මුද්‍රිත මධ්‍යයෙන් කියැවීමට දරුවන් උනන්දු කරවන මේ වැඩ පිළිවෙලේම තවත් වැදගත් අංගයක් වන්නේ දරුවන් සමග දෙගුරුන් මේ සඳහා මුසුවීමයි. මෙලෙස අන්‍යෝන්‍ය බැඳීම් දරුවනට හුරුවීම සුබදායී කටයුත්තකි. දරුවන් දැන් වඩාත් කියැවීමට උනන්දු බව ඇසීමට ලැබීමද සුබදායී පුවතකි.

වසර 2008 දී රෝවිල් ප්‍රදේශයේ ඇරඹුණ සිල්ක්වුඩ් ස්ටාර්ස් පෙර පාසලටත් සුරැකුම් මාධ්‍යස්ථානයටත් ලැබූ මෙම ජයග්‍රහණය ආයතන ප්‍රධෘනීන් කාර්ය මණ්ඩලය දෙමව්පියන් මෙන්ම දරුවන්ද දිරිගන්වන ජයග්‍රහණයකි. අපි ඔවුනට සුබ පතමු.